**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**<u>අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)</u>**

**<u>ප්‍රතිඵල නැවත සමීක්ෂණය</u>**

**<u>අයදුම්පත මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්</u>**

| |
|---|
| ප්‍රතිඵල නැවත සමීක්ෂණයේදී අදාළ පිළිතුරුපත් සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනකු යටතේ සම්පූර්ණයෙන් ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. නැවත සමීක්ෂණයේ ප්‍රතිඵල ලෙස ලකුණුවල හෝ ලැබී ඇති ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දැනගත යුතු බව අවධාරණය කරමි. |

1. **උක්ත විභාගයේ නැවත සමීක්ෂණ අයදුම්පත් මාර්ගගත ක්‍රමයට පමණක් කැඳවනු ලැබේ.**
2. **අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පාසල් හා පෞද්ගලික අයදුම්කරුවන් තමන් විසින්ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.**
3. **අයදුම්පත් භාරගැනීම 2024.10.01 දින ආරම්භ වන අතර 2024.10.14 දින අවසන් වේ.**
4. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීම පහත ක්‍රම ඔස්සේ සිදු කළ හැක.
   - විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (**https://www.doenets.lk**) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති මාර්ගගත අයදුම්පත් "පාසල් විභාග" මත Click කිරීම මඟින්
   - විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (Mobile Application) වන DOE වෙත පිවිස මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග) මත Click කිරීම මඟින්
   - **https://onlineexams.gov.lk/eic** වෙත පිවිසීම මඟින්
5. පද්ධතියට පිවිසීමේදී ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය හා ඔබ අ.පො.ස (සා.පෙළ) 2023 (2024) විභාගය සඳහා පෙනී සිටි විභාග අංකයම භාවිත කළ යුතුය.
6. අයදුම්පත් සම්පූර්ණ කිරීමට ප්‍රථම තාක්ෂණික උපදෙස් (Technical Instructions), පොදු උපදෙස් (Common Instructions) කියවීම සහ උපදෙස් වීඩියෝව නැරඹීම, නිවැරදි ආකාරයට අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.
7. එක් විෂයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 200/- කි. Credit කාඩ් / Debit කාඩ් මඟින් හෝ තැපැල් කාර්යාල මඟින් ගෙවීම් සිදු කළ හැකිය.
8. මුදල් ගෙවීමෙන් පසු අයදුම්පත PDF ක්‍රමයට බාගත (Download) කර ගත හැකි අතර, එම අයදුම්පත ඔබ භාරයේ තබා ගත යුතු ය. එසේම මුදල් ගෙවීමෙන් පසු ඔබගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් ද ලැබෙනු ඇත.
9. නැවත සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය සියලුම විෂයන් සහිතව නිවැරදිව අයදුම්පත සම්පූර්ණ කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වන අතර, නියමිත ගාස්තුව ගෙවා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.
10. අයදුම්පත් සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

සැ.යු. ❖ **පාසල් අයදුම්කරුවන්ගේ අයදුම්පත් සඳහා විදුහල්පතිගේ නිර්දේශය/අත්සන අවශ්‍ය නොවන බව කරුණාවෙන් සලකන්න.**

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

පාසල් විභාග ඇගයීම් ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල
2024.09.30